// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2375/36 – 2024 මාර්තු මස 15 වැනි සිකුරාදා – 2024.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/COM/03/2018/293.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.07.09 දිනැති හා අංක 2183/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.04.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ඉඹුල්ගොඩ, පහළ ඉඹුල්ගොඩ, අංක 49 ලිපිනයෙහි පදිංචි ඩබ්.ටී.කීර්ති පෙරේරා මයා සහ කොළඹ 12, ඩෑම් වීදිය, අංක 365 ලිපිනයෙහි පිහිටි දුල්මිණි එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/30/2020 හා 2024.01.30 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් (වැ.බ.).

2024 මාර්තු මස 04 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බේරුම් කරන අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

බේරුම්කරු ඩී.ජී.කේ. කරුණාරත්න මහතා ඉදිරිපිට දී ය.
ගොනු අංකය : IR/COM/03/2018/293.
*බේරුම්කරණ නඩු අංකය:* A/30/2020.

ඩබ්.ටී. කීර්ති පෙරේරා,
අංක 49, පහළ ඉඹුල්ගොඩ,
ඉඹුල්ගොඩ.

*පළමු පාර්ශ්වය*

**සහ**
දුල්මිනි එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 365,
ඩැම් විදිය,
කොළඹ 12.

2024 ජනවාරි මස 30 වන දින දීය, *දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල

නිපුනතා සංවර්ධන රැකී රක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සළකා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ආරාවුල සම්බන්ධව කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ යොමුව පහත පරිදි වේ.

''ලංකා ප්‍රින්සස් හෝටලය (Lanka Princess Hotel)'' යන නමින් ක්‍රියාත්මක වන දුල්මිනි එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටෙඩ් (Dulmini Enterprises (pvt)(Ltd) හි සේවය කරන ඩබ්.ටී. කිර්තී පෙරේරා මහතාට 2018 වර්ෂයට අදාල වැටුප් වර්ධක හා ප්‍රසාද දීමනා ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද ? අසාධාරණයක් සිදුව ඇතිනම් හිමිවිය යුතු සහන මොනවාද'' යන්න පිළිබඳව වේ.

මෙයට අදාලව කාර්මික ආරාවුලට හේතු වී ඇත්තේ,
01. 2018 වර්ෂය සඳහා මාසික වැටුප් වර්ධක හා ප්‍රසාද දීමනා ගෙවන ලෙස ඉල්ලීම.
02. 2018 වර්ෂයට ප්‍රසාද දීමනා හා වැටුප් වර්ධක නොගෙවීම නිසා මානසික පීඩනයට වන්දි ගෙවන ලෙස ඉල්ලීම යන්න ප්‍රධාන කරුණු වේ.

පෙනී සිටීම.
පළමු පාර්ශ්වය වෙනුවෙන් - ඉල්ලුම්කාර ඩබ්.ටී. කීර්ති පෙරේරා මහතා
දෙවන පාර්ශ්වය වෙනුවෙන් - නිතිඥ සන්තුෂ් පිරිස් මහතා
3. නිතිඥ අදිල් කාසිම් මයා
මානව සම්පත් කළමනාකාර සංජීව නිහාන්ත මහතා.
4. නීතිඥ උපේක්ෂා විමලවීර මහත්මිය
5. නීතිඥ ෂෙනාල් නෙර්සස්කෝ මිය
6 නීතිඥ හසිනි අතපත්තු මිය
7 නීතිඥ සී. ආර්. තලගල මයා
8. නීතිඥ ෂෙහාර පෙල්ල මුත්තු ද මිය.
පළමු පාර්ශ්වය විසින් සිය පළමු ප්‍රකාශය ගොනු කිරීමෙන් අනතුරුව දෙවන පාර්ශ්වය විසින් ගොනු කිරීමෙන් අනතුරුව දෙවන පාර්ශ්වය විසින් සිය පිළිතුරු ප්‍රකාශය ඉදිරිපත් කර තිබුණි. අනතුරුව පළමු පාර්ශ්වය විසින් ප්‍රති උත්තර ප්‍රකාශයේ ඉදිරිපත් කර ඇත.

මෙම පරීක්ෂණය 2021.02.09 වන දින ආරම්භ කොට 2023.09.20 වන දින අවසන් කරන ලදි. පරීක්ෂණය සඳහා පහත සඳහන් දින නියම කරන ලදි. 2021.02.09, 2021.03.31, 2021.05.06, 2021.06.29. 2021.07.15, 2021.12.10, 2022.02.15, 2022.03.10, 2022.04.20, 2022.05.04. 2022.05.18, 2022.06.24, 2022.06.29, 2022.08.08, 2022.09.21, 2022. 10.21, 2022.11.11, 2023.01.31, 2023.03.02, 2023.04.11, 2023.05.24, 2023.06.26, 2023.07.19. 2023.08.10, 2023.09.06, 2023.09.20 එහෙත් පරීක්ෂණය පහත සඳහන් දිනයන්හි පැවැත්තුවේ නැත. 2021.05.06, 2021.06.29. 2021.07.15. 2022.02.15. 2022.06.02, 2022.06.24, 2022.06.29, 2022.09.21, 2023.05.24, 2023.09.06 පරීක්ෂණය සඳහා දින නියම කර තිබිය දී හා එක්වතාවක් ඉල්ලුම්කරු නොපැමිණිම නිසා පරීක්ෂණ කටයුතු කල් තැබීම සිදු වීමත් පරීක්ෂණය බලාපොරොත්තු නොවූ ආකාරයට ප්‍රමාද වීමට හේතු විය.

ලිඛිත දේශන ලබා ගැනීම සඳහා 2023.09.06 දින නියම කළ ද ඉල්ලුම්කරු ඒ සඳහා 2023.09.20 දින ලබා දෙන ලෙස ඉල්ලීමක් කර තිබීම නිසා 2023.09.20 දින දක්වා පරීක්ෂණ කිරීමට නොහැකි විය.

**ප්‍රදානය :**

පළමු පාර්ශ්වයේ ඉල්ලීම

ඉල්ලුම්කරු 2013.01.01 දින තාවකාලික පදනමක් මත ලංකා ප්‍රින්සස් හෝටලයේ ආරක්ෂක කළමනාකාර තනතුරට බඳවා ගෙන 2013.11.01 දින තම තනතුරේ ස්ථිර කළ බව කාර්මික අධිකරණය වෙත ඒ - 1 දරන ලිපියෙන් දක්වා ඇත. එම ලිපියේ 4 වන ඡේදයේ 2018 වර්ෂයේ නොගෙවූ වැටුප් වර්ධක හා ප්‍රසාද දීමනා අත්හිටු වූ බව කළුතර සහකාර කම්කරු කොමසාරිස් වෙත පැමිණිලි කළ බව ද දන්වා ඇත.

කළුතර සහකාර කම්කරු කොමසාරිස් ලබා දුන් තීන්දුව ආයතනය විසින් ඉවත දමා 2018 අදාළ වැටුප් වර්ධක සහ ප්‍රසාද දීමනා ලබා නොදුන් බැවින් එය ලබා දෙන ලෙසට නියෝගයක් කරන ලෙසට ඉල්ලීමක් කර ඇත.

දෙවන පාර්ශ්වයේ පිළිතුර ː

(වයි 16 ලිපිය) 2018.06.08 දින ඉල්ලුම්කරුවෙකුට හිමි වැටුප් වර්ධක සහ ප්‍රසාද දීමනා ලබා නුදුන්නේ ඔහුගේ දුර්වල කාර්ය සාධනය හා විනයේ දුර්වලතාව නිසා බව වයි - 16 හි දක්වා ඇත. මෙම ලිපියේ පිටපතක් කළුතර සහකාර කම්කරු කොමසාරිස් වෙත ද යවා ඇති බව වයි - 16 ලිපියෙන් පැහැදිළි වේ. බේරුම්කරණයේ දී පළමු පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කාර එල් ටී කීර්ති පෙරේරා මහතාගෙන් සාක්ෂි මෙහෙයවන ලදි. ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් තමා මෙම පරීක්ෂණයේ ඉල්ලුම්කරු බවත් තමා 2013.01.01 දින ලංකා ප්‍රින්සස් ආයතනයේ ආරක්ෂක කළමනාකාර වශයෙන් තාවකාලික පදනම යටතේ බඳවා ගත් බවත් තමාගේ කාර්ය සාධනයේ වගකීම හා වගවීම ගැන සෑහීමකට පත්වූ කළමනාකාරීත්වය 2013.11.01 දින සිට නිත්‍ය සේවාවට දීමනා ඇතුලත් කර ගත් බවත් ප්‍රකාශ කළේය. 2017 වර්ෂය සඳහා තමාට නිසි වැටුප් වර්ධකයක් හෝ ප්‍රසාද දීමනාවක් ආයතනය විසින් ලබා නොදුන් බව ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් තවදුරටත් කියා සිටි. මේ සම්බන්ධයෙන් තමා සාමාන්‍යාධිකාරිවරයාගෙන් විමසූ විට කියා සිටියේ ඉහළ කළමනාකාරීත්වයේ ප්‍රසාදයක් නොමැති වීම නිසා වැටුප් වර්ධක හා ප්‍රසාද දීමනා ලබා නොදුන් බවයි. ( 2021.03.10 දින පැවැත්වූ සාක්ෂි වාරයේ දී 1 හා 2 පිටුවේ සටහන්)

2018 වර්ෂය සඳහා වූ වැටුප් වර්ධක හා ප්‍රසාද දීමනා නොගෙවූ බව ද එයට හේතුව විනය හා දුර්වල කාර්ය සාධනය බව ද ඉහළ කළමනාකාරීත්වය විසින් තමාට දැනුම් දුන් බව ද තවදුරටත් සාක්ෂි දෙමින් කියා සිටි. මේ සම්බන්ධව කළුතර සහකාර කම්කරු කොමසාරිස් වෙත දැන්වූ බව ද කොළඹ කාර්මික අධිකරණයට පැමිණිලි කරන ලෙස ඔහු විසින් උපදෙස් දුන් බව ද ඒ අනුව කොළඹ කාර්මික අධිකරණයේ පැමිණිලි කළ බව ද කියා සිටි.

ඉල්ලුම්කරු අවසන් වශයෙන් සාක්ෂි දෙමින් කියා සිටින්නේ 2019.05.25 වන දින තමා කැඳවා සිටි සාමාන්‍යාධිකාරිවරයා ඔහුගේ කාර්යාලයට කැඳවා මෙම ආරාවුල සමථයකට පත්කර ගැනීමට සඳහා යුරෝ 60,000.00ක මුදලක් ගෙවීම කළ බවත් තමා එයට අකමැති බව ප්‍රකාශ කර යුරෝ ලක්ෂයක් ඉල්ලා සිටි බවත් එයට එකඟ නොවූ නිසා යුරෝ 75,000 ක් සඳහා දෙපාර්ශ්වය එකඟ වූ බවයි. එම මුදලක ඉල්ලුම්කරු ඉල්ලා සිටී. 2017 සහ 2018 නොගෙවූ වැටුප් වර්ධක හා ප්‍රසාද දීමනා ඉල්ලා සිටී. ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති ඒ - 12 ලිපියේ යුරෝ 60000 ක් සඳහන් වේ.

දෙවන පාර්ශ්වය විසින් 2022.03.10 වන දින සැසි වාරයේ දී කියා සිටියේ හරස් ප්‍රශ්න නොමැති බවයි. මේ සම්බන්ධව මූලික පරීක්ෂණයක් පැවැත්වූ බව ටී. සී. කරුණාරත්න මහත්මිය සාක්ෂි දෙමින් කියා සිටි. (2022.05.04 දින සැසි වාරය) ඉල්ලුම්කරු පැමිණිල්ලෙන් කියා සිටින්නේ ප්‍රසාද දීමනා සහ වැටුප් වර්ධක නොගෙවූ බවයි. දෙවන පාර්ශ්වය ඊට පිළිතුරු දෙමින් කියා සිටින්නේ කාර්යක්ෂමතාවය හා පැමිණිමේ දුර්වලතා නිසා එසේ නොගෙවූ බවයි.

මේ දෙපාර්ශ්වය අතර සමථයකට පත් කර ගැනීම සඳහා තමා ගෙවීම් කළ බවත් ඊට දෙවන පාර්ශ්වය අකැමැති වූ බවත් පැමිණිලි පාර්ශ්වය කැමැති වූ බවත් තවදුරටත් සාක්ෂි දෙමින් සාක්ෂිකාරිය ප්‍රකාශ කළාය.

2022.10.21 දින පැවැත්වූ සැසි වාරයේ දී දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි මෙහෙය වන ලදී.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ මානව සම්පත් කළමනාකාර සංජීව නිශාන්ත මහතා විසින් සාක්ෂි ලබා දෙන ලදී. සාක්ෂිකරු විසින් වයි -1 සිට වයි - 17 දක්වා ලිපි ලේඛන ඉදිරිපත් කරමින් සාක්ෂි ලබා දී ඇත. තමා මෙම ආයතනයේ වසර 24 ක් පමණ කාලයක් සේවය කරන ලද බව ද සැලසුම් නිලධාරි ලෙස සේවයට බැඳී 2010 දී මානව සම්පත් අංශයට බඳවා ගත් බව ද එහි දී විවිධ උසස් වීම් ලැබ දැනට මානව සම්පත් කළමනාකරු වශයෙන් සේවය කරන බව ද තම තනතුරේ සේවා කාලය වසර 12 පමණ කාලයක් බවත් සාක්ෂි දෙමින් කියා සිටි. පළමු පාර්ශ්වයේ කීර්ති පෙරේරා මහතා 2011 සිට තමා හඳුනන බව ද කියා සිටී.

2014.08.26 වන දින ඉල්ලුම්කරු රාජකාරී හරියාකාරව ඉටු නොකිරීම සම්බන්ධයෙන් මෙමෝ පත්‍රයක් නිකුත් කර තිබෙන බව ද එය වයි - 7 ලෙස ලකුණු කර ඇත. 2015 දී ද අවවාදාත්මක මෙමෝ පත්‍රයක් ඉල්ලුම්කරුට නිකුත් කළ බව ද එය වයි -8 වශයෙන් ලකුණු කරන ලද බව ද කියා සිටි. ඉන්පසු 2017.01.27 දින සාක්ෂිකාරවරයා බොරු කීමත් සම්බන්ධයෙන් වයි - 9 දෙය මෙමෝ පත්‍රයක් නිකුත් කර ඇති බව ද කියා සිටි. මෙම දැඩි අවවාදාත්මක ලිපිය ලෙස සළකන බව ද එය නොසළකා හැරිය හොත් දැඩි ක්‍රියාමාර්ග ගන්නා බව ද වයි - 9 සඳහන් කර ඇත.

2015 සිට වරින් වර අවවාදාත්මක ලිපි නිකුත් කර ඇතත් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා තින්දුවක් ගත් බවත් සාක්ෂිකරු නොකියයි. අවවාදාත්මක ලිපි නිකුත් කළත් වයි - 10 න් ප්‍රසාද දීමනා ලබා දෙන්නේ නැති බව කියා සිටියත් වයි - 11 න් 50% ක ප්‍රසාද දීමනාවක් ලබා දීමට තීරණය කළ බව සාක්ෂිකරු කියා සිටි. එම ලිපිය ලියා ඇත්තේ 2017.03.29 දී ය. වයි - 13 ඉදිරිපත් කරමින් ඉල්ලුම්කරු නිසි පරිදි රාජකාරි ඉටු නොකළ බව කියා සිටි. රාජකාරි ඉටු නොකිරීම සම්බන්ධයෙන් 2018.02.01 දින අවවාදාත්මක ලිපියක් ඉල්ලුම්කරුට නිකුත් කළ බව ද එය වයි - 14 ලෙස ලකුණු කරන බව ද කියා සිටී. ඒ අනුව ඉල්ලුම්කරු එම වාර්තා ලබා නොදුන් බව ද කියා සිටී. 2014 සිට වරින් වර ඉල්ලුම්කරු රාජකාරි පැහැර හැරීම නිසා 2020.07.14 වන දින දක්වා සේවයෙන් පහ නොකළේ මන් ද යන ප්‍රශ්නය පැන නඟී. වයි - 17 ලිපිය ලකුණු කරමින් සාක්ෂිකරු කියා සිටින්නේ 2020.07.14 වන දින ඉල්ලුම්කරුගේ සේවය සමාප්ත කළ බවයි. (සාක්ෂි සටහන් 26 පිටුව)

සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසමින් ඉල්ලුම්කරු මෙසේ අසා සිටි.

ප්‍ර : සාක්ෂිකරු පවසා සිටියා ඉල්ලුම්කරු බඳවා ගන්නා ලද්දේ ආරක්ෂක කළමනාකාර තනතුරට කියලා?

පි : එසේය.

පි : බඳවා ගැනීමේ දැන්වීමේ කොතැනක හරි සඳහන් කළා ද තනතුර ආරක්ෂක හා සුරක්ෂණතා කළමනාකරු ලෙස?

පි : මගේ මතකයේ හැටියට නැහැ.

ප්‍ර : ඉල්ලුම්කරු ඉල්ලුම් කරන්නේ ආරක්ෂක කළමනාකාර තනතුර ද ?

පි : එසේය.

ප්‍ර : සම්මුඛ පරීක්ෂණය කරන අවස්ථාවේ දී සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය පිළිබඳව ඉල්ලුම්කරුගේ සුදුසුකම් පරීක්ෂා කර තිබේද ?

පි : ලේඛන වල එහෙම දෙයක් සඳහන් වෙන්නේ නැහැ.

පිළිතුරු වලින් ගම්‍යවන්නේ සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය

සාක්ෂිකරු එසේ කීවත් වයි - 6 හි පොස්ට් කියා සඳහන් වේ. ඉල්ලුම්කරු වයි - 6 ලිපියට අත්සන් කර ගොනු භාර ගෙන ඇත.

වයි - 7 අනුව මුළුතැන්ගෙය පිරිසිදුව තබා නොගැනීම සහ අවවාදාත්මක ලිපියක් ඉල්ලුම්කරුට නිකුත් කර නැති බව සාක්ෂිකරු කියා සිටී.

ප්‍ර : සාමාන්‍යයෙන් මුළුතැන්ගෙය හරියාකාරව පිරිසිදුව තිබෙන්නේ මොන වේලාවට ද?

පි : සාමාන්‍යයෙන් වැඩ අවසන් වූ පසුව තමයි හරියටම පිරිසිදු කරන්නේ මුළුතැන්ගේ.

ප්‍ර : සාක්ෂිකරුට කියන්න පුළුවන් ද රාත්‍රී කීයෙන් පසුව ද කියලා?

පි : වැඩ මුරය අවසන් වන්නේ රාත්‍රී 10 න් පසුව.

ප්‍ර : වයි - 7 අනුව ද වේලාවක් ද?

පි : නැත.

ප්‍ර : ඔබට කියන්න පුළුවන් ද සාමාන්‍යාධිකාරිතුමා මුළුතැන්ගෙට මොන වේලාවක යන්න ඇත්ද කියලා?

පි : ඒ සම්බන්ධයෙන් මට ප්‍රකාශයක් කරන්න බැහැ

ප්‍ර : සාක්ෂිකරු අවුරුදු 24 සේවා කාලයක් මෙම හෝටලයේ තියෙනවා?

පි : එසේයි.

ප්‍ර : සාක්ෂිකරු මුළුතැන් ගෙට ගොස් තිබෙනවාද?

පි : ගිහින් තිබෙනවා.

ප්‍ර : පළවන පැමිණිලිකරු මුළුතැන් ගෙයි පිසීමට ගන්නා දේවල් විට පැමිණීමේ හැකියාවක් නැද්ද?

පි : එහෙම අවශ්‍යතා තිබෙනවා නම් වැඩ කරන අවස්ථා වලදී ඒ වගේ දේවල් වෙන්න පුළුවන්.

සාක්ෂිකරුගේ මෙම හරස් ප්‍රශ්නවලට ලබා දුන් පිළිතුරු අනුව ඉල්ලුම්කරුගේ වරදක් නොපෙනේ. මුළුතැන්ගෙයි අඩුපාඩු දුටු සාමාන්‍යාධිකාරිවරයා විත්තිකාර පාර්ශ්වයට සාක්ෂිකරුවෙකු වශයෙන් නොකැඳවීම බලවත් අඩු පාඩුවකි.

වයි - 9 සම්බන්ධයෙන් මෙසේ හරස් ප්‍රශ්නයක් අසයි.

ප්‍ර : 3 වන වරටත් ඉල්ලුම්කරුට අවවාද ලිපියක් නිකුත් කළා එය වයි - 9 වශයෙන් නම් කර තිබෙනවාද?

පි : එසේයි.

සාමාන්‍යාධිකාරිවරයාට ඉල්ලුම්කරු බොරුවක් කීවාය කියා වයි - 9 සඳහන් වේ. සාමාන්‍යාධිකාරිවරයා සාක්ෂිය සඳහා නොකැඳවීම අඩුපාඩුවකි. ඔහු පැමිණි සාක්ෂි දුන්නා නම් මෙය තහවුරු කර ගැනීමට පහසුවනු ඇත. සාමාන්‍යාධිකාරිවරයා ඉල්ලුම්කරු බොරුවක් කිව්වා නම් 2017 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා වයි - 11 අනුව 50%ක් ලබා දෙන බවත් කියන්නේ නැත.

ප්‍ර : වයි - 16 ලේඛනය අනුව මොකක් ද තිබුණ විනය ක්‍රියා මාර්ගය?

පි : විනය ක්‍රියා මාර්ග විධිහට සඳහන් වන්නේ මීට පෙර නිකුත් කර තිබෙන අවවාදාත්මක ලිපි.

ප්‍ර : ඉල්ලුම්කරු කොතැනකවත් විනය කඩ කිරීමක් කරලා තියෙනවාද?

පි : විනය කඩ කිරීමක් සම්බන්ධයෙන් සටහන් වන්නේ නැහැ. අවවාදාත්මක ලිපි නිසා තමයි මේ ප්‍රකාශය කළේ

ප්‍ර : ඔබ අදහස් කරන්නේ මාගේ සේවා කාලය තුළ විනය කඩකිරීමක් සිදු වෙලා නැහැ කියලා?

පි : එහෙමයි. විනය කඩ කිරීමක් සිදු වෙලා නැහැ.

ප්‍ර : ගෘහස්ථ පරීක්ෂණ පවත්වන්නේ කවුද?

පි : ආයතනය විසින්.

ස්වාධීන පරීක්ෂණ නිලධාරියෙකු ලවා විධිමත් විනය පරීක්ෂණයක් මේ ඉල්ලුම්කරු සම්බන්ධයෙන් නොපැවැත්වීම බලවත් අඩුපාඩුවකි. එවැනි විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්තුවා නම් අවවාද ලිපි නිකුත් කොට තීරණ ගැනීම වඩා සාධාරණ වනු ඇත. විධිමත් විනය

පරීක්ෂණයක් නොපවත්වා ඉල්ලුම්කරුගේ වැටුප් වර්ධක හා ප්‍රසාද දීමනා 2018 අහිමි කිරීම ඉල්ලුම්කරුට කරන ලද අසාධාරණයක් බවට නිගමනය කරමි.

2017.09.01 සිට 2019.12.31 දක්වා සාමාන්‍යාධිකාරිවරු පස් දෙනෙක් පැමිණ සේවය කළ බව සාක්ෂිකරු පිළිගනී. මේ පස් දෙනාගේ සේවා කාලය තුළ සේවක ප්‍රශ්න සම්බන්ධයෙන් විවිධ ආකල්ප අනුව බලන්නට අදහස් කර සිතිය හැකිය.

සාක්ෂිකරු නැවත ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් මෙසේ කියයි.

ප්‍ර : එතකොට සාමාන්‍යධිකාවරයෙකුට බොරුකීම විනය කඩ කිරීමක් නොවේද?

පි : විනය කඩ කිරීමක් තමයි.

ඉල්ලුම්කරුගේ හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් සාක්ෂිකරු ඉල්ලීමක් විනය කඩ කිරීමක් කළ නොකළ බව කියා සිටී. (සාක්ෂි සටහන් 150 පිටුව) නැවත විමසීම් වලට පිළිතුරු දෙමින් විනය කඩ වීමක් සිදුකර ඇති බව කියා සිටි. (සාක්ෂි සටහන් 220 පිටුව) සාක්ෂිකරු අසත්‍ය ප්‍රකාශ කරන බව මින් පැහැදිලි වේ. මොහුගේ සාක්ෂිය පිළිගැනීම සම්බන්ධයෙන් සැකයක් මතු වේ.

හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් ප්‍රකාශ කළ දේ නැවත විමසීම් වලට වෙනස් කරයි. පිළිතුරු දෙමින් මෙම සාක්ෂිය ඇතැම් කාරණාවලදී පරස් පර විරෝධි බවක් පෙනේ.

ඉල්ලුම්කරු සිය ලිඛිත දේශනය ඉදිරිපත් කරමින් මෙසේ ප්‍රකාශ කර ඇත.

''ආරක්ෂාව සම්බන්ධ කළමනාකාරවරයෙක් වසර ගණක් කිසිදු චෝදනාවක් හෝ විනය විරෝධී ක්‍රියාවක් නොකොට ඉතා ද්වේෂ සහගත ලෙස මෙම ඉල්ලුම්කරුහට පදනම් විරහිත චෝදනා දිගින් දිගටම නගමින් අනුමිත ලෙස සේවයෙන් මෙම ඉල්ලුම්කරු නෙරපා හැරීමට උත්සහ දරා ඇත. පක්ෂපාති පරීක්ෂණයන් පවත්වා පරීක්ෂණ වාර්තාව හෝ එකී නිගමනයන් ලබා නොදී මෙම වගඋත්තරකාර ආයතනය රටේ පවතින කම්කරු නිතිය පවා කිසිදු තැකීමකට ලක් නොකර ඉතා වටිනා යෝජනාවක් අනුව මෙම සේවකයාට යුරෝ 60000 ක් දෙන බවට Email යවා ඇතත් දෙවන පාර්ශ්වයෙන් සාක්ෂිකරු ඒ කිසිවක් සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේ නැත.''

දෙවන පාර්ශ්වයේ ලිඛිත දේශනයේ සඳහන් කරන්නේ පළමු පාර්ශ්වයේ සිදුකර ඇති කාර්යයන්හි තත්වය දුර්වල බවත් අදාළ වාර්තා ප්‍රමාද වී ඇති බව හා සම්පූර්ණ නොවන වාර්තා සපයා ඇති බවත් y6 අනුව ආරක්ෂක කළමනාකරණ තනතුර පමණක් නොව ආරක්ෂක හා සුරක්ෂණතා තනතුරේ රාජකාරි කළ බවද කියා සිටී. දෙවන පාර්ශ්වය විසින් වැඩිදුරටත් සැළකර සිටින්නේ ප්‍රසාද දීමනා හා වැටුප් වර්ධක සේවකයා විසින් උපයාගත යුතු බවයි. ඒවා ලබාදීම පාලන අධිකාරියේ අභිමතය පරිදි ලබාදෙන බවත් එය ව්‍යවස්ථාපිත දිමනාවක් නොවන බවයි. දෙවන පාර්ශ්වයේ ඉල්ලා සිටින්නේ මෙම නඩුව නිෂ්ප්‍රභා කරන ලෙසටයි.

පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුට 2014.08.26 දින සේවය හරියාකාරව නොකල බවත් මෙය පළමු වන අවවාදය බවත් y7 ලිපියෙන් අවවාද කර ඇත. 2015.04.16 දින ඉල්ලුම්කරුට ලිපියක් නිකුත් කරමින් දෙවන අවවාද ලිපිය y8 නමින් නිකුත් කර ඇත. 3 වන අවවාද ලිපිය 2017.01.27 දින y9 ලෙස ඉල්ලුම්කරුට නිකුත් කර ඇත. නැවතත් 2018.02.20 වන දින ඉල්ලුම්කරුට අවවාදාත්මක ලිපියක් නිකුත් කර ඇත. එය y15 නමින් නම්කර ඇත. මෙම ලිපියේ විනය ක්‍රියා මාර්ගයක් ගන්නා බවද සඳහන් කර සිටී. 2020.07.14 වන දින හ y17 දරන ලිපිය මඟින් ඉල්ලුම්කරුගේ සේවය නතර කර ඇත.

ඉල්ලුම්කරු රජයේ සේවකයෙක් නොවේ. මෙම දෙවන පාර්ශ්වයේ ආයතනය පෞද්ගලික ආයතනයකි. 2014 සිට වරින්වර අවස්ථාවල ලිපි නිකුත් කරමින් සේවය අවසන් කිරීමට 2020 වනතුරු වසර හයක කාලයක් ගත කිරීම ගැන සැකයක් උපදී. ඉල්ලුම්කරුගේ සේවය එම ආයතනයට අවශ්‍ය වී තිබූ බව ඉන් ගම්‍යවේ. අවවාද ලිපි වරින් වර නිකුත් කරමින් වසර හයක් යන තුරු මෙම ඉල්ලුම්කරු සේවයේ යොදවාගෙන සිටීමට වඩා ස්වාධීන පරීක්ෂණ නිලධාරිවරයෙකු ලවා විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා වැරදි තිබේ නම් ඔහු සේවයෙන් ඉවත් කිරිම යුක්ති සහගත ය. එමෙන්ම එය නීතියට එකඟ වේ. වසර හයක් අවවාද ලිපි නිකුත් කරමින් 2014 සිට 2020 දක්වා ඉල්ලුම්කරු සේවයේ රඳවා ගෙන සිටියා නම් ඔහුට හිමි 2018 වැටුප් වර්ධක හා ප්‍රධාන දීමනා ගෙවීමට නියෝග කරමි.

වැටුප් වර්ධක ප්‍රධාන දීමනා මුදලින් කොටසක් ප්‍රමාණයක් දැයි පළමු පාර්ශ්වයෙන් ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් හෝ ඔහුගේ ලිඛිත දේශනයේ සඳහන් කර ඇත. එමෙන්ම දෙපාර්ශ්වයේ ද මූල්‍යමය වශයෙන් වැටුප් වර්ධක හා ප්‍රධාන දීමනා පහත සඳහන් කර නැත. එබැවින් එය ලබා ගැනීම සඳහා නැවතවරක් දෙපාර්ශ්වය කැඳවීමට සිදු විය. එබැවින් 2018 ට ඉල්ලම්කරුට හිමි වැටුප් වර්ධක හා ප්‍රධාන දීමනා ගෙවන ලෙසට දෙවන පාර්ශ්වයට නියෝග කරමි. දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර තිබෙන වැටුප් වාර්තා අනුව පළමු පාර්ශ්වයට 2018 වර්ෂය වෙනුවෙන් වැටුප් වර්ධක හා ප්‍රසාද දීමනා ගෙවා නොමැති බව සනාථ වෙයි. පළමු පාර්ශ්වය ප්‍රකාශ කර සිටින්නේ 2018 වර්ෂයේ වැටුප් වර්ධක හා ප්‍රසාද දීමනා ගෙවා නැති බවයි.

එබැවින් 2018 වර්ෂය සඳහා වැටුප් වර්ධක වශයෙන් රු. 7515.00 ක් හා ප්‍රසාද දීමනා වශයෙන් රු.66,000.00 ක් පළමු පාර්ශ්වයේ ඩබ්.ටී. කීර්ති පෙරේරාට ගෙවන ලෙසට දෙවන පාර්ශ්වයට නියෝග කරමි.

මෙම නියෝගය *ගැසට් පත්‍රයේ* පළකරන දින සිට දින 14 ක් ඇතුළත උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන ලෙසට මෙයින් නියම කරමි. තවද මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළ කරන දින සිට මසක් ඇතුළත ක්‍රියාත්මක කර ඒ බව උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත දැනුම් දෙන බව මෙයින් නියම කරමි. තවද ඉල්ලුම්කරුට හිමි සේවක අර්ථ සාධක හා අනෙකුත් දීමනා සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් ජනරාල්තුමා වෙත ඉල්ලුම් කිරීමට මෙම ප්‍රදානය බාධාවක් නොවේ. මෙම තීරණය සාධාරණ සහ යුක්ති සහගත තීරණයක් බවද සටහන් කරමි.

නීතිඥ ඩී.ඩී.කේ. කරුණාරත්න
බේරුම්කරු

EOG 03 - 0127

---

*මගේ අංකය*: IR/COM/03/2020/267.

## කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.10.24 දිනැති හා අංක 2355/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.10.18 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මාතලේ, අළුවිහාරය, කුඹුරු කොටුව පාර, නදී සෙවණ, අංක 45/2 ලිපිනයෙහි පදිංචි පී.බෝයගොඩ මහතා සහ කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 34 ලිපිනයෙහි පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/58/2023 හා 2023.12.30 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් (රා.ආ.).

2024 පෙබරවාරි මස 27 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

පී.බෝයගොඩ මහතා,
අංක 45/2,
නදී සෙවණ,
කුඹුරු කොටුව පාර,
අළු විහාරය,
මාතලේ.

IR/COM/03/2020/267.
*නඩු අංකය:* A/58/2023.

**එදිරිව**

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
අංක 34,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ - 02.

වග උත්තරකරු

අතර පවතින ආරාවුල,

**බේරුම්කරණ තීන්දු ප්‍රකාශය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කරන ලදි.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ.

''පී. බෝයගොඩ මහතා වැටුප් රහිතව වැඩ තහනම්ව සිටි 1999.03.30 වන දින සිට 2010.12.01 දක්වා වූ කාලය සඳහා වැටුප් වර්ධක පදනම් කරගෙන හිඟ වැටුප් හා උසස්වීම් සඳහා හිමිකමක් තිබේද හිමිකමක් තිබේ නම් ලැබිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ''

මෙම කාර්මික ආරාවුල සම්බන්ධව අදාළ පාර්ශ්වයන් 2023.11.07 වන දින බේරුම්කරණ අධිකරණය වෙත කැඳවන ලදී. එහිදී දෙවන පාර්ශ්වය හෙවත් වග උත්තරකාර පාර්ශ්වය බේරුම්කරණ අධිකරණය හමුවේ පවසා සිටියේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි නීති අංශයට අදාළ ලේඛන ලැබීමේ ප්‍රමාදයක් සිදුව ඇති බැවින් වෙනත් දිනයක් ලබා දීමට කටයුතු කරන ලෙසයි. එම ඉල්ලීම් පිළිගනිමින් නැවත නඩු වාරය 2023.11.28 වන දින කැඳවන ලදී. එහිදී පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය තම තමන්ගේ පළමු විස්තර ප්‍රකාශන ගරු අධිකරණය වෙත ලබා දෙන ලදී. මෙහි දී දෙවන පාර්ශ්වය විසින් තම මූලික විරෝධතා ගොනු කරන ලදී. එමෙන්ම නැවත නඩු විභාගය 2023.12.15 වන දින පැවැත්වීමට යෙදුනි. මෙහිදී පළමු පාර්ශ්වය තම දෙවන විස්තර ප්‍රකාශය ලබා දුන් අතර, දෙවන පාර්ශ්වය මෙම දෙවන විස්තර ප්‍රකාශනය ලබා දීමේ ගැටළුදායක තත්වයන් පවතින බව පෙන්වා දෙන ලදී. ඒ අනුව එම දෙවන විස්තර ප්‍රකාශය සතියක් ඇතුළත ලබා දීමට එකඟ වූ අතර එය ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතු බවට නියෝග කෙරුණි. මෙම විස්තර ප්‍රකාශය හා මූලික විරෝධතා අධ්‍යයනය කොට තවදුරටත් මෙම නඩුව පවත්වාගෙන යා යුතු ද නැතහොත් මූලික විරෝධතා අනුව නඩුව නිශ්ප්‍රභා කළ යුතුද යන්න තීරණය කළ යුතු වේ. මෙහිදී වැඩිදුරටත් මෙම තීරණය ගැනීමට සාක්ෂි විමසීමට අවශ්‍ය නොවන බවත්, නඩුකරණය පවත්වාගෙන යා යුතු බවට තීරණය කරන්නේ නම් පමණක් සාක්ෂි විමසීම ප්‍රමාණවත් බවද දෙපාර්ශ්වයට මෙම බේරුම්කරණ අධිකරණය ඉදිරියේ එකඟතාවය ප්‍රකාශ කෙරුණි. ඒ අනුව පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කරමි.

මෙහි පළමු පාර්ශ්වය 1980.11.11 වන දින සිට නිවාස නිලධාරි වශයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ සේවයට බැඳී ඇති අතර එසේ සේවය කරමින් සිටියදී 1999.03.30 වන දින සේවය තහනම් කර ඇත. ඉන් පසු 2003.01.16 වන දින සේවයෙන් පහ කර ඇත. එසේ සේවයෙන් පහ කිරීම අසාධාරණ බැවින් 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත යටතේ එවකට ඔහු සේවය කල අධිකරණ බල ප්‍රදේශය වූ අනුරාධපුර කම්කරු උසාවියේ නඩු අංක 27/අනු/1115/2003 යටතේ පවරනු ලැබූ නඩු විමසීමෙන් පසු 2010.10.25 වන දින ගරු සභාපති/ අතිරේක මහේස්ත්‍රාත්තුමා විසින් නියෝගයන් නිකුත් කරමින් සේවක තැනගේ සේවය අවසන් කිරිම අයුතු සහගත බවට නිගමනය කරමින් සිත්තම් පලම් නාදන් එදිරිව මහජන බැංකුව 1989 ශ්‍රී ලංකා වාර්තා 124 නඩුවේදී උගත් විනිසුරුතුමන්ලා විසින් එළඹි තීරණයන් වල නිර්ණායකයන්ට අනුගතව සේවකයා සේවයෙන් පහ කළ 2003.01.16 වන දින සිට ලැබිය යුතු සියළුම හිඟ වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභයන් සහිතව නැවත සේවයේ පුනපත් කිරීමට සේවා යෝජකයාට නියෝග කළ අතර මෙහි සේවා යෝජක (දෙවන පාර්ශ්වය) එකී නඩු නියෝගය කඩ නොකර ක්‍රියාත්මක කළ බවත්, සැල කර සිටින අතර, එම නියෝගයෙහි පිට පතක් A1 ලෙස ගොනු කර ඇත. මෙම නඩු නියෝගය අනුව සේවකයා සේවයෙන් පහ කළ දින එනම් 2003.01.18 දින සිට ලැබිය යුතු සියළුම හිඟ වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභයන් සහිතව නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කර ඇත.

මෙහි පළමු පාර්ශ්වය වයස සම්පූර්ණ වීම මත 2018 වර්ෂයේදී විශ්‍රාම ලබා ගත් අතර එසේ විශ්‍රාම ලබා ගැනීමේදී 1983 අංක 12 දරන පාරිතෝෂිත පනත අනුව ලැබිය යුතු ප්‍රතිලාභ වල අඩු ගණනය කිරීමක්ද 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදලේ අඩු දායක මුදල් බැර වීමක් ද සිදු වී ඇති අතර, ඒ අනුව පළමු පාර්ශ්වයට මූල්‍යමය හානියක් සිදුවී ඇති අතර මෙම නඩුකරණයට අදාලව එකී අහිමි කළ වැටුප් හා දීමනා වල අගයන් ඇතුළත් වාර්තාව X1 ලෙස ගොනු කර ඇත.

පළමු පාර්ශ්වය ගරු බේරුම්කරණ අධිකරණයෙන් අයද සිටින්නේ,

(අ) ගරු කම්කරු විනිශ්චයාධිකරණයෙන් A1 යටතේ නිකුත් කළ නඩු නියෝගය නොසලකා හරිමින් කටයුතු කිරීම වෙනුවෙන් පළමු පාර්ශ්වයට සිදු කර ඇති X1 හි සඳහන් මූල්‍යමය හානිය සැලකිල්ලට ගෙන හිමිකම් අහිමි කිරීම ස්වාභාවික නීතියේ මූලධර්ම උල්ලංඝනය කිරීමක් සේ නිගමනය කොට X1 හි සඳහන් මුදල ගෙවන ලෙසට සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක්ද,

(ආ) නොගෙවන ලද හා / හෝ අඩුවෙන් ගණනය කරන ලද දීමනා වලට අයත් ව්‍යවස්ථාපිත දීමනා ගෙවන ලෙසට ප්‍රදානයක්ද,

(ඇ) මෙම බේරුම්කරණ අධිකරණයට උචිත යැයි හා අවැසි යැයි හැඟෙන වෙනත් සහනයක්ද ලබා දෙන ලෙසය.

මෙම නඩුකරණයෙහි දෙවන පාර්ශ්වය හෙවත් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තම විරෝධතා ගොනු කරමින් කරුණු පැහැදිළි කර ඇත. මෙම නඩුවේ විසඳිය යුතු ප්‍රශ්නය වසර 24 කට අධික කාලයකට පෙර (1999 වර්ෂයේ) සිදු වූ සිද්ධියක් හා බැඳෙන අතර, එම කාල වකවානුවේ සිට මේ වනතුරු කිසිදු අවස්ථාවක පළමු පාර්ශ්වය විසින් මෙම කාරණය පිළිබඳව කටයුතු කර නැති බවත් ඒ නිසා සාධාරණත්ව නීතියේ මූලික මූලධර්මයන් වන සාධාරණය පතන්නා නොපමාව කටයුතු කළ යුතු බවත් ප්‍රමාදය සාධාරණත්වය ව්‍යාර්ථ කරන බවත් (Delay Defeats Equity) ඒ නිසා පළමු පාර්ශ්වය වසර 25 කට ආසන්න කාලයක් තම අයිතිවාසිකම් මත නිදාව සිට (Sleeping on one's right) නඩුවක් ගොනු කර සාධාරණත්වය පැතීමට කිසිදු නෛතික අයිතිවාසිකමක් නොමැති බව මෙම පාර්ශ්වය ලිඛිත දේශනවලින් පෙන්වා ඇත.

තවදුරටත් දෙවන පාර්ශ්වය පෙන්වා දෙන කරුණක් වනුයේ මෙම ආරවුලට පදනම් වී ඇති කරුණු සහ ඊට අදාළ කාලවකවානුව සම්බන්ධයෙන් පළමු පාර්ශ්වයට අනුරාධපුර කම්කරු විනිශ්චය සභාව විසින් සහන ලබා දී ඇති බවත්, එකම කාරණය සම්බන්ධව යලිත් සහන ඉල්ලීමට පළමු පාර්ශ්වයට හිමිකමක් හෝ නෛතික පදනමක් නොමැති බවත් එම සහන පිළිබඳව පළමු පාර්ශ්වය සෑහීමකට පත් නොවූයේ නම් ඔහු කළ යුතුව තිබුණේ එම නියෝගයට එරෙහිව මහාධිකරණය වෙත අභියාචනයක් ගොනු කිරීම බවත්ය. මෙම තත්වය මත මූලික විරෝධතාවයක් සේ සලකා අගති රහිතව පළමු පාර්ශ්වය අදාළ යොමුවෙහි දන්වා ඇති කාර්මික ආරාවුල පිළිබඳ පැමිණිල්ල නිෂ්ප්‍රභා කරන ලෙසත් ඉල්ලා ඇත.

නඩුකරය පවත්වාගෙන යාම හෝ පැමිණිල්ල නිෂ්ප්‍රභා කිරීම පිළිබඳව දෙපාර්ශ්වය ලබා දුන් ලිඛිත ලේඛන වලට අනුකූලව ගරු බේරුම්කරණ අධිකරණය පහත සඳහන් විසඳිය යුතු කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී

**01. මෙම බේරුම්කරණ අධිකරණයට යොමු වී ඇති කාර්මික ආරාවුලට හේතුව කුමක්ද යන්න.**

පී. බෝයගොඩ මහතා සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර, එනම් පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය අතර, ඇති වී ඇති කාර්මික ආරාවුල වී ඇත්තේ පී. බෝයගොඩ මහතා වැටුප් රහිතව වැඩතහනම්ව සිටි 1999.03.30 දින සිට 2010.12.01 දක්වා වූ කාලය සඳහා වැටුප් වර්ධක පදනම් කරගෙන හිඟ වැටුප් සහ උසස් වීම් සඳහා හිමිකමක් තිබේද හිමිකමක් තිබේ නම් ලැබිය යුතු සහනයන් කවරේද යන්න වේ.

මෙම ඉල්ලීම සම්බන්ධව පළමු පාර්ශ්වය මෙම බේරුම්කරණ අධිකරණයෙහි වැඩිදුරටත් අයැද සිටින සහනයන් වී ඇත්තේ

අ) ගරු කම්කරු විනිශ්චයාධිකරණය A1 යටතේ නිකුත් කළ නඩු නියෝගය නොසලකා හරිමින් කටයුතු කිරීම වෙනුවෙන් පළමු පාර්ශ්වයට සිදු කර ඇති මූල්‍යමය හානිය සැලකිල්ලට ගෙන X1 සඳහන් මූල්‍යමය හානිය ගෙවන ලෙසටද,

ආ) නොගෙවන ලද හා / හෝ අඩුවෙන් ගණනය කරන ලද දීමනා වලට අයත් ව්‍යවස්ථාපිත දීමනා ගෙවන ලෙසට ද,

ඇ) ගරු අධිකරණයට උචිත යැයි මැනවයි හැගෙන වෙනත් සහනයන් ලබා ගැනීම ද වේ.

මෙම ඉල්ලා ඇති සහනයන් සම්බන්ධව දෙවන පාර්ශ්වය පෙන්නුම් කරන්නේ අනුරාධපුර කම්කරු විනිශ්චය සභා අංක 27/අනු/1115/2003 දරන නඩුවේ නියෝගය ප්‍රකාරව පැමිණිලිකරු වෙත අදාළ සහන මේ වන විටත් ලබා දී ඇති බවය.

එම නියෝගය පහත දැක්වේ.

ඉල්ලුම්කරු විසින් වගඋත්තරකාර ආයතනය ඉදිරිපත් කළ A1 දරන ලේඛනය එනම් 2000.04.04 දිනැති චෝදනා පත්‍රයේ 14 වන චෝදනාවට ඉල්ලුම්කරු වැරදිකරු බවට වැඩි බර සාක්ෂි මත ඔප්පු වුවද ඉහත දක්වන ලද කරුණු ප්‍රකාරව ඉල්ලුම්කරුගේ සේවය අවසන් කිරීම සාධාරණ හා යුක්ති සහගත නොවන බැවින් හා සිත්තම්පලම්නාදන් එරෙහිව මහජන බැංකුව 1989 (1) ශ්‍රී ලංකා වාර්තා 124 නඩුවේදී ප්‍රකාශ කර ඇත්තේ සේවය කඩ කිරීමක් නැති ලෙස සලකා අදාළ සේවකයා සේවයෙහි පහ කළ දින (2003.01.16) සිට ලැබිය යුතු සියළුම හිඟ වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභයන් සහිතව නැවත සේවයේ පිහිටුවීමට නියෝග කරන ලදී. සේවකයා විශ්‍රාම ගත යුතු වයසට පැමිණ ඇත්නම් හිඟ වැටුප් වලට අමතරව සේවයේ කඩවීමක් නැති ලෙස සලකා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභයත්, ගෙවිය යුතු බව ද තීරණය කරන ලදී. ඉල්ලුම්කරු පෙර සේවයේම සේවා කඩවීමක් තොරව පසු වැටුප් සහිතව සේවයේ පුනවත් කිරීම වඩාත් සුදුසු බව නිගමනය කරමි. ඒ අනුව ඉල්ලුම්කරු පෙර සේවා තත්වයේම සේවා කඩවීමකින් තොරව පූර්ණ මාස 94 ක වැටුප් සමඟ 2010.12.01 දින සිට නැවත සේවයේ පුනපත් කරන මෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට නියම කරමි.

ඉල්ලුම්කරුගේ අවසන් මාසික වැටුප රු.6500 ක් ලෙස ඉල්ලුම්කරු සාක්ෂි දී ඇති අතර, එය වග උත්තරකරු අභියෝගයට ලක් කර නොමැති බැවින් ගෙවිය යුතු වැටුප වශයෙන් රු. 6500 x 94 = රු. 610,000 ක මුදලක් ඉල්ලුම්කරුට ගෙවීමට වග උත්තරකරුට නියම කරමි. ඒ අනුව රු. 610,000 ක මුදල ලබා ගත හැකි පරිදි 2010.12.31 වන දින හෝ ඊට ප්‍රථම අනුරාධපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කරන ලෙස වග උත්තරකරුට නියෝග කරමි.

**02. මෙම කාර්මික ආරාවුල බේරුම්කරණ අධිකරණය තුළ පවත්වා ගෙන යාමට නීතියේ මූල ධර්මයක් වන සාධාරණත්වය පතන්නා නොපමාව කටයුතු කර ඇත්ද යන්න**

මෙම නඩුවේ දෙවන පාර්ශ්වය සඳහන් කරන්නේ වසර 25 කට ආසන්න කාලයක් තම අයිතිවාසිකම් මත නිද්‍රාව සිට නඩුවක් ගොනුකර සාධාරණත්වය පැතීමට කිසිදු නෛතික අයිතිවාසිකම් නොමැති බවයි. මෙම ගැටළුව සම්බන්ධව පළමු පාර්ශ්වය දීර්ඝ වශයෙන් ලිඛිතව කරුණු දක්වා ඇත.

පළමු පාර්ශ්වය 2013.04.10 වන දින කම්කරු කොමසාරිස්ට මෙම ආරාවුල යොමු කර ඇති බවත්, ඒ අනුව 2013.05.08/ 2013.07.14/ 2013.12.11/ 2017.02.22/ 2019.09.07/ 2019.12.04/ 2020.02.19/ 2020.09.09/ 2020.10.26 ආදී වශයෙන් කම්කරු කොමසාරිස් විසින් පරීක්ෂණ පැවැත්වූ බවත්, එම පරීක්ෂණ සඳහා දෙවන පාර්ශ්වය වන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහභාගි වී ඇති බවත්, ඒ නිසා මෙම පැමිණිල්ල සම්බන්ධව නිල වශයෙන් පෙනී සිටිය යුතු බවට දෙවන පාර්ශ්වය බැඳී සිට ඇති බවයි. එමෙන්ම මෙම ආරාවුල කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය අනුව පවත්වාගෙන යා හැකි බවත්ය. කාර්මික ආරාවුල් පනතේ නියෝග අනුව විෂයභාර ඇමතිවරයාට යම් කාර්මික ආරාවුලක් බේරුම් කිරීම සඳහා මැදිහත්වීමට නිශ්චිත කාල සීමාවකට යටත් කරමින් අමාත්‍යවරයාට කිසිදු කොන්දේසියකට යටත් කර නොමැති බවටද කරුණු දක්වා ඇත. විෂය භාර අමාත්‍යවරයාට ඇති බලතල සම්බන්ධයෙන් වැඩිදුරටත් Nadaraga Vs Krisnadasan (1975) NLR 255 ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව ද Colombo Apothecaries Compant Ltd Vs Wijayasuriya (1968) 70 NLR හා 481 Walkers Sons Ltd Vs Fry (1966) 68 NLR දරන නඩු තීන්දු ද උදාහරණ වශයෙන් දක්වා ඇත.

ඉහත විසඳිය යුතු ප්‍රශ්නයන්ද සැලකිල්ලට ගෙන බේරුම්කරණයට ඉදිරිපත්ව ඇති පී. බෝයගොඩ හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර, පවතින මෙම ආරාවුල සම්බන්ධව මතු කොට ඇති මූලික විරෝධතා එනම් මෙම නඩුකරය තවදුරටත් පවත්වා ගෙන යා යුතුද. එසේ නැතිනම් පැමිණිල්ල මුල් අවස්ථාවේදී නිෂ්ප්‍රභා කරන ලෙසට සිදු කර ඇති විරෝධතා පිළිබඳව පහත සඳහන් තීන්දුව ප්‍රකාශයට පත් කරමි.

දෙවන පාර්ශ්වය විසින් පෙන්වා දෙනු ලැබූ එකී විරෝධතාවයක් වූ පළමු පාර්ශ්වය වසර 25 කට ආසන්න කාලයක් තම අයිතිවාසිකම් ලබා ගැනීමට නිද්‍රාව සිටි යන තර්කය පිළිගත නොහැක්කේ පළමු පාර්ශ්වය දිගින් දිගටම කම්කරු කොමසාරිස්වරයා වෙත මෙම ආරාවුල යොමු කර තිබීමත්, එමෙන්ම දෙපාර්ශ්වය සමඟ දිගින් දිගටම පරීක්ෂණ පවත්වා තිබීමත් හේතුවෙන්ය. නමුත් දෙවන පාර්ශ්වය විසින් තවදුරටත් පෙන්වා දී ඇත්තේ මෙම ආරාවුලට පදනම් වී ඇති කරුණු සහ ඊට අදාළව අනුරාධපුරය කම්කරු, විනිශ්චය සභාව විසින් නිසි සහන ලබා දී ඇති බවයි. එකම කරුණ සම්බන්ධයෙන් යලි යලිත් සහන ඉල්ලීමට පළමු පාර්ශ්වයට හිමිකමක් නොමැති බව මෙම බේරුම්කරණ අධිකරණයේ ද තීරණය වේ.

අනුරාධපුර කම්කරු අධිකරණයේදී අංක 27/අනු/1115/2003 යටතේ උගත් විනිසුරුතුමන් ලබාදුන් තීන්දුව අභියෝගයට ලක් කරමින් ද, එම සහන පිළිබඳව සෑහීමට පත් නොවුනේ නම් පළමු පාර්ශ්වයට මහාධිකරණය වෙත සුදුසු අභියාචනයන් ගොනු කළ හැකිව තිබුණු නමුත් එසේ සිදු කර නොමැත.

එබැවින් දෙවන පාර්ශ්වය විසින් සිදු කර ඇති මූලික විරෝධතාවය පිළිගනිමින් පැමිණිල්ල නිෂ්ප්‍රභා කිරීමට තීරණය කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව සඳහන් කරමි. තවදුරටත් ව්‍යවස්ථාපිත හිමිකම් අයදුම් කිරීමට මෙම තීරණය බාධාවක් නොවේ.

**ආචාර්ය කේ. ඒ. තිලකරත්න,**
(බේරුම්කරු)

2023 දෙසැම්බර් මස 30 වැනි දින

EOG 03 - 0128

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.